# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2081/12 – 2018 ජූලි 24 වැනි අඟහරුවාදා – 2018.07.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

1991 ඔක්තෝබර් මස 23 වැනි දින අංක 685/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 1991 අංක 143 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 03ජේ/91/එල්ආර්බී/75.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරීගේ අංකය: ජීසීඑෆ්/ඒටීඑච්/එන්ජී/13/එල්ආර්.
2018 ජූලි මස 17 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, නුගේගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාවල (කොට්ඨාස අංක 4, නාවල, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කො 7937 සහ 2018.05.31 දිනැති සංශෝධිත මූලික පිඹුරේ පෙන්නුම් කර ඇති පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 10 – කැන්දගහ කුඹුර, කජුගහවෙල කුඹුර, දවටගහ කුඹුර සහ බක්මීගහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.6323**

උතුරට: හිමිකම් කියන අය සහ වරි. අංකය සොයාගත නොහැකි ඉඩම සහ කැබලි අංක 11 සහ 12; නැගෙනහිරට: කැබලි අංක 12 සහ 13; දකුණට: කැබලි අංක 13; බටහිරට: කැබලි අංක 13, හිමිකම් කියන අය සහ වරි. අංකය සොයාගත නොහැකි ඉඩම සහ කැබලි අංක 11.

08 – 333